# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## ප්‍රාසංගික කලාවේදී (ගෞරව) උපාධි අවසාන වසර පරීක්ෂණය - 2019/2020

## නර්තන හා නාට්‍ය කලා පීඨය

## <u>සන්දර්භය තුළ රංග කලාව – 20 වන සහ 21 වන සියවස්හි ලෝක නාට්‍ය ප්‍රවණතා</u>

## <u>DDRA 41013/ DDRD 41013</u>

කාලය :- පැ 02

❖ **සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.**

---

❖ **මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සමන්විත ය.**
❖ **<u>ප්‍රශ්න හතරකට (04) පමණක්</u> පිළිතුරු සපයන්න.**
❖ **සෑම ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කරන්න.**
❖ **සියලුම ප්‍රශ්න සඳහා සමාන ලකුණු ලැබේ. (මුළු ලකුණු 40 කි)**

---

01. බර්ටෝල් බ්‍රෙෂ්ට්ගේ රංගකලා ප්‍රවේශයෙහි මූලධර්මයක් වන තදාත්ම්‍ය විඝටනය (Alienation effect) සංකල්පය ඔහුගේ නිෂ්පාදන උපක්‍රම නිදර්ශනාත්මකව ගෙනහැර දක්වමින් විස්තර කරන්න.

02. හැරල්ඩ් පින්ටර්ගේ රචනා විලාසය තුළ පවත්නා වියුක්ති සහගත ගුණය (absurdity) පිළිබඳ විවරණයක් ඉදිරිපත් කරන්න.
(මේ සඳහා සිංහල භාෂාවෙන් පළවූ "කඳුකර භාෂාව" (Mountain Language), "කොන්තරාත්තුව" (The Dumb Waiter), "අළු" (Ashes to Ashes) යන කෘතීන් ඇසුරු කරන්න)

03. නූතනවාදී නාට්‍ය රචනාවන්හි පවත්නා ප්‍රධාන සාහිත්‍යමය ප්‍රවේශ පිළිබඳ අර්ථ විවරණාත්මක විග්‍රහයක් ඉදිරිපත් කරන්න.
(ඇන්ටන් චෙකෝෆ්, හෙන්රික් ඉබ්සන්, බර්නාඩ් ෂෝ, ඉයුජින් ඕනීල් ඇසුරෙන්)

04. සමකාලීන වේදිකා භාවිතයන් ඔස්සේ සම්ප්‍රදායික ඇරිස්ටෝටලියානු රංගකලා න්‍යායික ප්‍රවේශය අභියෝගයට ලක්වන ආකරය සනිදර්ශනාත්මකව පහදන්න.

05. සමාජ විපර්වර්තනීය අරමුණු උදෙසා රංගකලා භාවිතයක් ලෙස ඔගස්ටෝ බොආල්ගේ පීඩිතයාගේ රඟමඬල (Theatre of the Oppressed) රංග කලා භාවිතය ප්‍රයෝගිකව යොදාගත හැකි ආකාරය පිළිබඳ විවරණයක් සපයන්න.

………………….                                                  2023.01.20